**ශ්‍රී ලංකා වරාය කලමනාකරණ හා උපදේශන සේවා (පෞද්ගලික) සමාගම - 2023**

**------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වරාය කලමනාකරණ හා උපදේශන සේවා (පෞද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍ර.වි.ලං.ශ්‍රී)අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අනුකූල නොවීම.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 17.18 වගන්තියට අනුව වත්කම් වල ඉතිරි වටිනාකම හෝ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂිත ආයු කාලයට පෙර ඇස්තමේන්තුවට වඩා වෙනස් වේ නම්, ඵලදායි ජීවිත කාලය නැවත ඇස්තමේන්තු කළ යුතුය. එහිදී ක්ෂය වීමේ ක්‍රමය හා ප්‍රයෝජනවත් ජීවිත කාලය ඊට අනුකූලව වෙනස් කළ යුතු වුවද ඊට අනුකූල නොවන ලෙස මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති රු.5,341,525ක වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර ඒවා නැවත සමාලෝචනයකින් තොරව තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. | 2025දී ආයතනයේ ස්ථාවර වත්කම් සමාලෝචනය කිරීමට නියමිත අතර එහිදී අදාළ කාර්යයන් සිදු කිරීමට නියමිතය. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs ) හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) 17.18 වගන්තියට අනුව වත්කම් වල ඉතිරි වටිනාකම හෝ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු බව. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) 21.15 වගන්තියට අනුව වගකීම් නිරවුල් කිරිමේදී ආයතනයේ සම්පත් පිටතට ගලායාමේ හැකියාවක් ඇති වගකීම් සම්බන්ධයෙන් ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සහ වෙන්කිරීම් කළ යුතු වුවද වරාය කළමනාකරණ උපදේශන සේවා සමාගම මඟින් වරාය අධිකාරියේ ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන් 2004 වර්ෂයේදී Tangyo Haulage පුද්ගලික සමාගමෙන් ප්‍රවාහන රථ 14ක් ගිවිසුම් පදනම මත ලබාගෙන තිබූ අතර එය අධිකාරිය මඟින් නවතා දැමීම හේතුවෙන් සැපයුම්කාර | වරාය අධිකාරියට අවශ්‍ය උපකාරක සේවා සැපයීම මෙම සමාගමෙහි මූලික අරමුණක් බැවින් ඒ අනුව ඉහත සේවාව ලබා දී ඇති අතර මෙම සේවාව නැවැත්වීම තුළ ඇති වියහැකි නීතිමය ගැටලුව සම්බන්ධව ගිණුම් තුළ අසම්භාව්‍ය බැරකම් හා 22.2හි 2 පරිච්ඡේදයේ දක්වා ඇත. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) 21.15 වගන්තියට අනුව වගකීම් නිරවුල් කිරිමේදී ආයතනයේ සම්පත් පිටතට ගලායාමේ හැකියාවක් ඇති වගකීම් සම්බන්ධයෙන් ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සහ වෙන්කිරීම් කළ යුතු බව. |

සමාගම නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර ඒ සඳහා රු.මිලියන 28.9ක වන්දි මුදලක් සැපයුම්කරු වෙත ගෙවන ලෙස අධිකරණය නියම කර තිබුණි. නමුත් වන්දි මුදල වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීමක් ද කර නොතිබුණු අතර අධිකරණ තීන්දුව අභියාචනය සඳහා රු.මිලියන 2.5ක් ගෙවීමට නිතීඥ සමාගම සමඟ ගිවිසගෙන තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබා ගෙන නොතිබුණි.

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ලැබිය යුතු ගිණුම් | 135,946,028 | 91,428,528 | 44,517,500 | සමාගම විසින් 2023 වර්ෂයට අදාළව වරාය අධිකාරියට ලබා දී ඇති සේවාවන් සඳහා නිකුත් කර ඇති ඉන්වොයිසීන් අනුව ශේෂය මෙහි සඳහන් කර ඇති අතර එම ශේෂයන් තහවුරු කරමින් ජාතික විගණන කාර්යාලයේ වරාය අධිකාරියේ ශාඛාවටත් නැව් සංස්ථාවේ ජාතික විගණන ශාඛාවටත් පිටපත් කරමින් 2024 ජනවාරි 3 දින වරාය අධිකාරියේ මුදල් අධ්‍යක්ෂ වෙත විද්‍යුත් තැපැල මඟින් තොරතුරු යවා ඇත. | වරාය අධිකාරිය සමඟ සාකච්ඡාමය පියවර ගෙන ශේෂයන් සැසඳුම් කර නිවැරදි ශේෂයන් ගිණුම්ගත කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |
| ගෙවිය යුතු ගිණුම් | 11,993,878 | 5,955,164 | 6,038,714 | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරාය අධිකාරියට අයත් මැකලම් ගේට් පරිශ්‍රය භෝජනාගාරයක් පවත්වාගෙන යාම සඳහා 2018 පෙබරවාරි 01 දින සිට 2023 ජනවාරි 31 දින දක්වා වසර 05ක් සඳහා තෙවන පාර්ශවයක් සමඟ ගිවිසුම් ගත වී තිබූ නමුත් 2020 අප්‍රේල් සිට අගෝස්තු දක්වා එම පාර්ශවය විසින් සමාගම වෙත ගෙවිය යුතු හිඟ | මේ සම්බන්ධව නිතීමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තුමේන්තුවට යොමුකර ඇත. | අදාළ අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට සමාගම කටයුතු කළ යුතු බව. |

මුදල වන රු.4,477,679ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. එසේම අදාල දේපල බදු ගිවිසුමකින් නිත්‍යානුකූලව වරාය අධිකාරියෙන් පවරා නොගෙන මෙම පරිශ්‍රය නැවත වෙනත් තෙවන පාර්ශවයට උප බදු දීම සඳහා 2023 මාර්තු 01 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර එබැවින්, ගිවිසුම්වල නිත්‍යානුකූල නොවන භාවය හේතුවෙන් සමාගම උපයා ගැනීමට තිබූ ආදායමක් සමාලෝචිත වර්ෂය තුළ අහිමි වී තිබුණි.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරණ සමාගම් පනතේ 131 (1) උපවගන්තිය | සමාගමක් විසින් වාර්ෂික වාර්තාවක් යටත් පිරිසෙයින් සෑම වර්ෂයකට වරක් නියමිත ආකෘතියෙහි සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු වුවද, ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම විසින් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වාර්ෂික වාර්තාව වාර්ෂිකව ඉදිරිපත් කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. සමාගම විසින් සමාගම් පනතෙහි 131 (1) උපවගන්තියට අනුව කටයුතු කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක සමාගම් පනතෙහි 131 (4) (අ) (ආ) උපවගන්තිවලට අනුව සමාගම වරදකට වරදකරු වන අතර පැහැර හැරීම් සිදුකරන ලද සමාගමේ සෑම නිලධරයෙකුටම ඒ සම්බන්ධයෙන් වරදකරු වන බවද දක්වා තිබුණු නමුත් ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | එකඟ වේ. | සමාගම් පනතේ සඳහන් ප්‍රතිපාදන අනුව වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට සමාගම කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 223 (ඇ) (i) හා (ii) උප වගන්ති | සමාගමේ අධ්‍යක්ෂවරයෙකු හෝ ලේකම්වරයා හෝ පත්කිරීමේ නැතහොත් ඉල්ලා අස්වීමේ වෙනසක් සිදු වූ විට ඒ වෙනස පිළිබඳව පළමුවරට සමාගමට දැනගන්නට ලැබීමෙන් අනතුරුව වැඩකරන දින විස්සක් ඇතුළත නියමිත ආකෘතියට අනුව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීමට සමාගම කටයුතු කළ යුතු වුවද 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට සම්බන්ධ වෙනස්කම් 38ක් සිදු වී ඇති බව නිරීක්ෂණය වූ අතර සමාගම විසින් සමාගම් පනතේ විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වේ .මෙය 2024දී නිවැරදි කර වාර්තා සියල්ල සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තුමේන්තුවේ ලියාපදිංචි කර යාවත්කාලීන කර ඇත. | සමාගම් පනතේ සඳහන් ප්‍රතිපාදන අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදුවන වෙනස්කම් සමාගම් රෙජිස්ටාර් වෙත දැනුම්දීමට සමාගම කටයුතු කළ යුතු බව. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,410,435ක් ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.7,125,632ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,715,197ක පසුබැසීමක් නිරීක්ෂණය විය. කම්කරුවන් කුලියට සැපයීමේ සේවාවෙන් ලැබුණු ආදායම රු.26,606,522කින් එනම් සියයට78 කින් අඩුවීම, හා වෙනත් ආදායම්වලින්ලද ආදායම රු.1,519,108කින් එනම් සියයට 72 කින් පහත වැටීම මෙම පසුබැසීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2024 වර්ෂයේදී නීති සහ වෘත්තීය ගාස්තු වියදම් රු.2,851,679ක් වූ අතර 2023 වර්ෂයේ එය රු.5,155,587ක් විය. ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.2,303,908කින් එනම් සියයට 81 කින් නීති සහ වෘත්තීය ගාස්තු වියදම් ඉහළ ගොස් තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රවර්තන වර්ෂයේ ජංගම ගිණුම් 04ක රු.මිලියන 34.9ක් රඳවා ගෙන තිබූ අතර එකී මුදල් ඵලදායී අයෝජන කටයුත්තක යොදවා හෝ ස්ථිර තැන්පතුවක යොදවා පොලී ආදායමක් උපයා ගැනීමට සමාගමේ කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | පසුගිය වසර කිහිපය තුළ සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම් දෙපාර්තුමේන්තුවේ ලියාපදිංචි කිරීම නිසියාකාරව සිදුව නොමැති වීමෙන් යාවත්කාලීන කරන ලද තොරතුරු (Form 20, Form 15) බැංකු වලට ලබාදීමට නොහැකි විය.එම නිසා සමාගමෙහි බලයලත් අත්සන්කරුවන්ගේ අත්සන් හෝ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය පිළිගැනීමට බැංකු එකඟ නොවීම නිසා 2023 මාර්තු මස සිට 2024 මාර්තු දක්වා කාලය තුළ එහි මුදල් ආයෝජනය කිරීමට හැකියාවක් නොවුණි. නමුත් 2024වසර මුල එහි ගැටලු අවසන් කර ඇති බැවින් බැංකු එම මුදල් නිසි පරිදි මේ වන විට කලමනාකරණය කරමින් පවතී. | මුදල් ඵලදායී අයෝජන කටයුත්තක යොදවා හෝ ස්ථිර තැන්පතුවක යොදවා පොලී ආදායමක් උපයා ගැනීමට කටයුතු කළයුතු බව. |
| (ආ) | පසුගිය වර්ෂ 5 හි 2019-2023 ගාලුමුවදොර පිටිය පරිපාලනයේ ආදායම් වියදම් පරික්ෂාවේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම සියයට 548ක් වී තිබුණි. | 2022 නොවැම්බර් මස ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ ඇතිකර ගෙන ඇති ගිවිසුම ප්‍රකාරව ආදායම මත සියයට 20ක කලමනාකරණ ගාස්තු 2023 වසරට අදාලව රු.4,044,199 ක් ගෙවා ඇත. එය ඍජු වියදමක් වශයෙන් හඳුනාගෙන ඇති බැවින් ගාලු මුවදොර මෙහෙයුම් අලාභය වැඩිවීමට මෙන්ම සමාගමෙහි සමස්ථ ලාභය අඩුවීමට එයට බලපා ඇත. | මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කර ලාභ ඉපයීමට කටයුතු කලයුතු බව. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වර්ග අඩි 22,456 ක වපසරියකින් යුත් බදු දේපලක් වාර්ෂිකව රු.459,857කට ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව හා තක්සේරු කටයුතු සිදු කිරීමකින් තොරව 2014 වර්ෂයේ සිට එකම පුද්ගලයෙකු වෙත ලබාදී තිබුණද ඒ සම්බන්ධයෙන් ගිවිසුම්ගත වීමට අදාළ කටයුතු සිදුකර නොතිබුණි. | අදාළ ගෙවීම් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | සමාගමේ මානව සම්පත ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු අතර අනවශ්‍ය වියදම් අවම කළ යුතු බව. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මානව සම්පත් කළමනාකරණ ගැටලු හා නීතිමය ගැටලු විසඳීමේ අරමුණෙන් සමාලෝචිත වර්ෂයේ රු.1,682,143ක් දීමනා ලෙස ගෙවා නිලධාරින් දෙදෙනෙකු බඳවාගෙන තිබුණු නමුත් ඔවුන් සඳහා කිසියම් රාජකාරි පැවරුමක්, කාලීනව අධීක්ෂණයක් හා ඉටුකළ කාර්ය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. සමාගමේ එකී නඩු කටයුතු සඳහා බාහිර පාර්ශවයක් වෙත අවස්ථා 14කදී රු.3,310,032ක් ගෙවා තිබුණි. | අදාළ ගෙවීම් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | සමාගමේ මානව සම්පත ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු අතර අනවශ්‍ය වියදම් අවම කළ යුතුය. |
| (ii) | 2021 නොවැම්බර් 16 දිනැති මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් අත්පොත | | |
| (අ) | 3.1 (i) පරිච්ඡේදය අනුව,<br>සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේ දී අනුගත වීමට කටයුතු කරනු ලැබේ. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව සමාගමේ සේවක සංඛ්‍යාව අනුමත කර ගැනිමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |
| (ආ) | 3.2 පරිච්ඡේදය අනුව,<br>සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේ දී අනුගත වීමට කටයුතු කරනු ලැබේ. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් බඳවා ගැනිමේ පටිපාටියක් සකස් කර රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනිමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති මුදල් අමාත්‍යාංශයේ රාජ්‍යව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශය සංග්‍රහය 2.3 පරිච්ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම 2023 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී සකස්කර අනුගතවීමට කටයුතු කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |